ඇබෑර්තු

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

තාක්ෂණ අමාත්‍යාංශය

පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසි අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩය (HM 2-1)

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

සුදුසුකම් - බාහිර

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (වසර හතරක්) හෝ විද්‍යාවේදී විෂය ධාරාවේ (භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව, අහාර විද්‍යාව, රෙදිපිළි, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, පරිසර විද්‍යාව, ධීවර, කෘෂිකර්මය, ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, අනුක ජීව විද්‍යාව, ගණිතය, තොරතුරු තාක්ෂණය හෝ සංඛ්‍යානය) විශේෂ උපාධිය (වසර හතරක්) හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් (වසර තුනක්)

සහ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාවේදී / ඉංජිනේරු / කෘෂි විද්‍යාව / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

ඉහත තනතුර සඳහා වන පළපුරුද්ද

සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සාධනීය සාර්ථක රැකියා වාර්ථාවක් සහිතව, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර දහනවයක (19) කළමනාකාර මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර හතක් (07) ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ වියයුතුය.

සහ

නිසි යෙදවීම පිළිබඳව පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වය දීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව.

අභ්‍යන්තර (පහත 01 හෝ 02)

01. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.
02. ඉහළ කළමනාකාරීත්ව මට්ටමේ, අධ්‍යක්ෂ (තාක්ෂණික) / අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුරේ අවම වශයෙන් වසර හතරක (04) සේවා පළපුරුද්ද.

සහ

නිසි යෙදවීම පිළිබඳ පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වය දීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව. තෝරාගනු ලබන අපේක්ෂක වෙත අංශ පහක් අධීක්ෂණය කිරීමේ වගකීම පවරනු ලැබේ.

වැටුප් පරිමාණය : ලංකා රු. 91,645.00 - 12x2 700.00 - ලංකා රු. 124,045.00

වයස : අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 55 නොවිය යුතුය. (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

අධ්‍යක්ෂ - ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩය (HM 1-3)

අධ්‍යක්ෂ (පරිපාලන)

සුදුසුකම් - බාහිර

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන හෝ මානව සම්පත් කළමනාකරණ උපාධිය (වසර හතරක)

සහ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ, රාජ්‍ය කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලනය පිළබඳ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

ඉහත තනතුර සඳහා වන පළපුරුද්ද

සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සාධනීය සාර්ථක රැකියා වාර්ථාවක් සහිතව, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර පහළොවක (15) කළමනාකාර මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර තුනක් (03) ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ වියයුතුය.

සහ

නිසි යෙදවීම පිළිබඳව පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වයදීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව.

අභ්‍යන්තර (පහත 01 හෝ 02)

01. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලන පිළබඳ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සමාජිකත්වය ලබා තිබීම සමග ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරේ අවම වශයෙන් වසර තුනක (03) සාර්ථක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

සහ

නිසි යෙදවීම පිළිබඳ පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වය දීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව. තෝරාගනු ලබන අපේක්ෂකයා පරිපාලන අංශය භාරව කටයුතු කළයුතු අතර ආයතනයේ පරිපාලන කටයුතු සඳහා වගකීම් දරනු ලබයි. සියලුම මට්ටමේ කාර්ය මංණ්ඩලය සමග කටයුතු කිරීම පහසු කරන පරිදි හොඳ නායකත්වයක් සහ සන්නිවේදන නිපුණතා සහිත අයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය : ලංකා රු. 86,865.00 - 15 x 2 270.00 - ලංකා රු. 120,915.00

වයස : අවුරුදු 35 ට අඩු නොවියයුතු අතර අවුරුදු 55 නොවිය යුතුය (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

අධ්‍යක්ෂ - ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩය (HM 1-3)

අධ්‍යක්ෂ (මුදල්)

සුදුසුකම් - බාහිර

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක් (වසර හතරක)

සහ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළබඳ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

ඉහත තනතුර සඳහා වන පළපුරුද්ද

සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සාධනීය සාර්ථක රැකියා වාර්ථාවක් සහිතව, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර පහළොවක (15) කළමනාකාර මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර තුනක් (03) ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ වියයුතුය.

සහ

නිසි යෙදවීම පිළිබඳව පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වයදීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව.

අභ්‍යන්තර (පහත 01 හෝ 02)

01. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සමාජිකත්වය ලබා තිබීම සමග ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් / විගනන) තනතුරේ අවම වශයෙන් වසර තුනක (03) සාර්ථක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

සහ

නිසි යෙදවීම පිළිබඳ පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වය දීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව. තෝරාගනු ලබන අපේක්ෂකයා මුදල් අංශය භාරව කටයුතු කළයුතු අතර පිළිගත් ගිණුම්කරණය පිළිබඳව පිළිගත් ප්‍රමිතීන් හා රජයේ නීති හා රෙගුලාසි අනුව ආයතනයේ මුදල් කළමනාකරණය කිරීමේ වගකීම දරයි.

වැටුප් පරිමාණය : ලංකා රු. 86,865.00 - 15 x 2 270.00 - ලංකා රු. 120,915.00

වයස : අවුරුදු 35 ට අඩු නොවියයුතු අතර අවුරුදු 55 නොවිය යුතුය. (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

අධ්‍යක්ෂ - ජ්‍යෙෂ්ඨ කළමනාකාර කාණ්ඩය (HM 1-3)

අධ්‍යක්ෂ (තාක්ෂණ)

සුදුසුකම් - බාහිර

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (වසර හතරක්) හෝ විද්‍යාවේදී විෂය ධාරාවේ (භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව, අහාර විද්‍යාව, රෙදිපිළි, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, පරිසර විද්‍යාව, ධීවර, කෘෂිකර්මය, ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, අනුක ජීව විද්‍යාව, ගණිතය, තොරතුරු තාක්ෂණය හෝ සංඛ්‍යානය) විශේෂ උපාධිය (වසර හතරක්) හෝ පංති සාමාර්ථයක් සහිතව සාමාන්‍ය උපාධියක් (වසර තුනක්)

සහ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරට අදාළ, විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

ඉහත තනතුර සඳහා වන පළපුරුද්ද

සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සාධනීය සාර්ථක රැකියා වාර්ථාවක් සහිතව, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් වසර පහළොවක (15) කළමනාකාර මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර තුනක් (03) ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ වියයුතුය.

සහ

නිසි යෙදවීම පිළිබඳව පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වයදීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව.

අභ්‍යන්තර (පහත 01 හෝ 02)

01. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහාවන සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් **(Masters)** හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සමාජිකත්වය ලබා තිබීම සමග ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) / ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරේ වසර තුනක (03) සාර්ථක සේවාවක් සම්පූර්ණ කර තිබීම.

සහ

නිසි යෙදවීම පිළිබඳ පළපුරුද්දක් සහිතව බහුකාර්ය කණ්ඩායම්වලට නායකත්වය දීමේ සහ නියෝග කිරීමේ සාධනීය හැකියාව සහ මානව සම්පත් හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව. තෝරාගනු ලබන අපේක්ෂකයා වෙත අංශය පහක් අධීක්ෂණය කිරීමේ වගකීම පවරනු ලැබේ.

වැටුප් පරිමාණය : ලංකා රු. 86,865.00 - 15x2 270.00 - ලංකා රු. 120,915.00

වයස : අවුරුදු 35 ට අඩු නොවියයුතු අතර අවුරුදු 55 නොවිය යුතුය. (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

අනෙකුත් ප්‍රතිලාභ

01 පවරන ලද වාහනයක් හෝ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED1/2015 සහ PED1/2015 (i) ප්‍රකාරව ප්‍රවාහන දීමනාවක්
02 භාවිත නොකළ වෛද්‍ය නිවාඩු මුදල් ගත කිරීම
03 ජීවිත රක්ෂණ ආවරණය සහ වෛද්‍ය රක්ෂණ ආවරණය
04 සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ප්‍රති පූර්ණය කිරීම
05 මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති පරිදි වාර්ෂික දිරිගැන්වීමේ ගෙවීම්
06 වෘත්තීය පරිසරයක රැකියාවේ නියුක්ත වීමේ අවස්ථාව
07 වෘත්තීය දීමනාව
08 සන්නිවේදන දීමනාව

සම්පූර්ණ නම, වයස, අධ්‍යාපනික සුදුසුකම් හා අනෙකුත් අදාළ විස්තර සමග සහතිකවල පිටපත් හා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සඳහන් කරන ලද අයදුම්පත **2021.03.15** වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08"** යන ලිපිනයට ලියාපදිංචි තැපල් මගින් යොමුකළ යුතුය. රාජ්‍ය අංශයේ ආයතනවල සේවයේ නියුතු අයවලුන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමුකළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)